Page 4 October 2010.qxd 19/10/2010 05:47 Page 1





ලී ක්වාන් යූ Lee Kuan Yew
The first Prime Minister of the state of Singapore



Dr Mahathir Bin Mohamad
The father of new Malaysia
මහාතිර් මොහෙමඩ්

**ඔව්හු ඡන්ද පවත්වමින් තට්ටු මාරු ක්‍රමයට පාලනය වෙනස් නොකළහ. එවැනි තට්ටු මාරු ක්‍රමවලට කණ්ඩායම් වෙනස් කිරීම ක්‍රිකට් ක්‍රීඩාවට හොඳය. රටක් පාලනය කොට එම රට ඉදිරියට ගෙන යෑම ක්‍රිකට් ක්‍රීඩාව නොවේ.**

1 වෙනි පිටුවෙන්.........

# නැටවෙන තාලෙට....

කළ බැවින් වැඩි ජන කොටස සහ භූමිය අයත් මැලේ ජාතිකයින්ට අසාධාරණ සිදුවෙතැයිද ඒ සඳහා මැලේ ජාතිකයින් මුහුණ දී ප්‍රශ්න විසඳාගත යුතු යයිද යන හැඟීම මතුවෙමින් පැවතිණ.

අගමැති ඇතුළු රජය එම 1969 කැරළි වලදී ක්‍රියා කළ ආකාරය විවෘතව විවේචනය කිරීමේ චෝදනාව මහාතීර්ට විරුද්ධව නැගුණු අතර ඔහුව ජාතික සංගමයෙන්ද නෙරපාහරිනු ලැබීය. ඉන්පසු මහාතීර් මැලේ ජාතික නිදහස අරහයා ජාතික සටන දිගටම ගෙන ගියේය. සිය අදහසක් දක්වමින් ඔහු ඒක්හ ෲසකැපප් නොහොත් මැලේ ජාතියේ බැරෑරුම් ප්‍රශ්නය නමැති පොත ලියා පළකළේය. එහෙත් රජය විසින් එම පොත තහනම් කරන ලදී.

මැලේ ජාතිය ආර්ථික වශයෙන් ප්‍රබල කිරීමට සුදුසු ආර්ථික ප්‍රතිපත්තියක්ද, ඔවුනට උදව් කරන **භූමි පුත්‍ර සංකල්පය** ද මේ ප්‍රකාශන වලින් බිහිවිණ. ඒවා දිගටම ඉදිරියට ගෙන ගිය මහාතීර් 1974 සිට නැවත ආසන නිතරඟයෙන් දිනාගනිමින් ඇමතිධූරවලට පත්වූ අතර 1981 දී ඔහුට රටේ අගමැතිධූරයද පහසුවෙන් හිමි විය. ඔහුට පෙර අගමැතිකම් කළ තිදෙනාම මැලේසියාවේ පැරණි රාජකීය පෙළපත් වලින් පැවත එන අය වූහ. සාමාන්‍ය පවුලකින් බලයට පත්වූ ප්‍රථමයා මහාතීර් ය.

එතැන් සිට 2003 දක්වා නොකඩවාම අගමැති ධූරයට පත්වෙමින් කටයුතු කළ මහාතීර් යටතේ මැලේසියාව එදා පැවති ඌන සංවර්ධිත (under developed) තත්වයෙන් මිදී දියුණුවට පත්වෙමින් ප්‍රථම ලෝකයේ :ඝසරිඑ උදරකා– තත්වයට නැංවී ඇත. ඔහු සිය ජාතික අදහස් එළිදැක්වූ පොතෙහි සංකල්ප පදනම් කරගත් නව ආර්ථික ප්‍රතිපත්තිය ( New Economic Policy) අද මැලේසියාවේ ඇති මහා පරිමාණයේ සංවර්ධනයන්, දියුණු කළ තෙල් සම්පත්, ක්‍රමවත්ව සැකසුණු මහා මාර්ග හා විදුලි ව්‍යාපෘති ආදී සම්පත් සියල්ලට හා ඉහළ දියුණුවට නිදසුන්ය.

ලෝක බැංකුව, බ්‍රිතාන්‍යය, ඇමරිකාව ආදීන්ගේ ගෝලීයකරණ වැඩපිළිවෙලවල් මහාතීර් දැඩි විවේචනයට ලක්කළේය. 1997 දී සිංගප්පූරුව, තායිවානය, දකුණු කොරියාව ආදි අග්නිදිග ආසියා ආර්ථික අර්බුදයට මුහුණ දුන් අවස්ථාවේ ලෝක බැංකුව මැලේසියාවටද අර රටවලටම වාගේ එම අර්බුදයෙන් ගොඩ ඒමට මැලේසියාවටද වැඩ පිළිවෙලක් යෝජනා කළේය. එය කෙළින්ම ප්‍රතික්ෂෙප කළ මහා තීර් සිය නව ආර්ථික ප්‍රතිපත්තිය එම අර් බුදයෙන් රට ගොඩගැන්මට ප්‍රබල වෙතැයි ප්‍රකාශ කළේය. ඇත්ත වශයෙන්ම එම අර්බුදයෙන් අන් සියළු රටවල් දුෂ්කරතාවන්ට මුහුණ දුන්නද මැලේසියාව නොවැටී ඉදිරයට ගියේය. ඒ ඔහුගේ ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රබලතා නිසා සිදුවුනෙකැයි අද ලෝක බැංකුව ද පිළිගෙන ඇත.

මහාතීර් මොහොමඩ් මහතා දැනට දේශපාලනයෙන් විශ්‍රාම ගෙන ඇතත් අදද සිය දේශයට හිතවත්ව උපදේශකයෙකු වශයෙන් කටයුතු කරයි.

## ලී ක්වාන් යූ

ලී ක්වාන් යූ 1967 සිට 1990 දක්වා පුරා අවුරුදු 23 ක් සිංගප් පූරුවේ අගමැති වශයෙන් නොක ඩවා පාලනය ගෙන ගියේය. 1923 දී සිංගප්පූරුවේ උපත ලැබූ ලී ක්වාන් තම මූලික අධ්‍යාපනය ලැබූයේ එංගලන්තයේය. එයට පසු සිය මව්බිමටආ ඔහු එහි දේශපාලනයට පිවිසුනේය. 1950 ගණන් වලදී බ්‍රිතාන්‍ය පාලනය යටතේ straights settlements යනුවෙන් හැඳින්වුණු අද මැලේසියාව අයත් ප්‍රදේශ එනම් සිංගප් පූරුව, ජාවා, සුමාත්‍රා ආදී ප්‍රදේශ සියල්ලම බ්‍රිතාන්‍ය පාලනයේ යටත් විජිත වූහ. එයට පසු බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස් වුවද සිංගප්පූරුවද මලයා සමූහාණ්ඩුවේ කොට සක් වශයෙන් දිගටම පැවතුණි. 1963 සිට 1965 දක්වා පාලනයේ සිටි මැලේ ජාතිකයින්ද ජන සංඛ්‍යාවෙන් අඩුවූ මුත් ධන බලයෙන් ප්‍රබල වූ චීන ජාතිකයින්ගෙන් සමන්විත වූ සිංගප් පූරු වද අතර ගැටුම් ඇතිවිය. 1965 දී සිංගප්පූරුව මලයා සමූහාණ්ඩුවෙන් නෙරපනු ලැබීය.

ඒ වන විට ලී ක්වාන් යූ සිංගප් පූරුවේ ප්‍රධාන දේශපාලන පක්ෂය වූ ඡැදචකැ' ඡඑදබ ඡරඑහ ජනතා ක්‍රියාකිරී පක්ෂය ගොඩනගාගෙන තිබුණි ඔහු එහි ප්‍රධාන ලේකම් ධූරය දැරීය. 1965 දී සිංගප්පූරු සමූහාණ්ඩුව පිහිටුවාගෙන (Republic of Singapore) ලී ක්වාන් එහි ප්‍රථම අගමැති විය. එදා සිට වසර 25 ක්ම එම රාජ්‍යයේ අගමැති වශයෙන් ඡන්ද දිනමින් එක දිගට පාලනය කළේය. අදත් සිංගප්පූරුව ජනගහනය මිලියන පහක් වන මහා නගරයකි. සමස්ත සිංගප්පූරු රාජ්‍යය ද එම නගරයටම සීමා වෙයි.

අග්නිදිග ආසියාවේ මුහුදු නැව් මාර්ග සන්ධි ස්ථානයක පිහිටි සිංගප්පූරුව කාලයක සිට වෙළඳ මධ්‍යස්ථානයක්ද විය. භූමි හෝ භව භෝග සම්පත් නැති එම ජන රජයට ඇති එකම සම්පත එහි මිනිස් සම්පතෙහි ඇති හැකියාව සහ ශ්‍රමයයි. මෙම සාධකය රටේ දියුණුවට උපයෝගී කරගෙන හසුරුවමින් දශක දෙක තුනකින් රට ඌන සංවර්ධිත තත්වයෙන් මුදවා ගෙන ලොව ප්‍රථම මට්ටමේ රාජ්‍යයක් බවට සිංගප්පූරුව පත්කරන්නට ලී ක්වාන් යූට හැකිවී ඇත.

සිංගප්පූරුවට පරිභෝජනය සඳහා කෘෂිකාර්මික ද්‍රව්‍ය පමණක් නොව ජලය පවා ගෙන්වාගන්නේ මැලේසියාවෙනි.

1970 දී වුවද කුඩා කඩ, වෙළඳහල් ආදියෙන් පිරී තරමක අපිරිසිදු තත්වයක තිබූ සිංගප්පූරුව අද තට්ටු ගොඩනැගි, මහා වෙළඳ සංකීර්ණ, අති දියුණු මංමාවත්, උමං දුම්රිය ආදියෙන් සමන්විත, අති පිරිසිදු කමෙන් යුත්, ප්‍රථම ලෝක මට්ටමේ දැවැන්ත නගරයකි. සිංගප්පූරු වරාය අද ලෝකයේම ඇති ප්‍රථම මට්ටමේ වරාය වලින් එකකි. එසේම ගුවන්සේවය අතින්ද සිංගප්පූරුව සිටින්නේ ඉතාමත් ඉදිරියෙනි.

මේ නිදසුන් කීපයක් පමණකි. මේ සියල්ල ගොඩනැගීම සඳහා ජනතාව නීතිගරුකව හසුරුවමින් සිය සම්පූර්ණ කාලයම කැපකළ ලී ක්වාන් යූ ඉමහත් ජනතා ගෞරවයට පාත්‍රවෙමින් වසර 25 ක් තිස්සේ සිංගප්පූරුවේ ප්‍රථම අගමැති වශයෙන් කටයුතු කොට 1990 දී විශ්‍රාම ලැබීය. නමුත් අද ද ඔහු Minister Mentor හෙවත් ඇමති උපදේශකවරයෙකු වශයෙන් කටුයතු කරයි.

## ඒ දෙරටෙන් ගත හැකි ආදර්ශ

ඒ රටවල් දෙකේ සංවර්ධනයත්, ඒ නායකයින් දෙදෙනා කටුයතු කළ ආකාරයත් විමසා බැලීම වටී. ඒ දෙදෙනම ස්වකීය ජනතාව අනාගතයේදී මුහුණ දෙන සන්ධිස්ථාන වලදී සිය වගකීම නොපිරිහෙලා ඉටු කළ නායකයෙ-ා් වූහ. දෙදෙනම අවශ්‍ය වැදගත් මොහොතේදී ජනතා අභිප්‍රාය නිවැරදිව හඳුනාගෙන මෙහෙයවීමට හැකි පුද්ගලයෝ වූහ. යායුතු මග පැහැදිලිව අඳුනාගෙන සිටියහ. අවශ්‍යතාව අනුව හැඩගැසී ඊට අනුරූපව ක්‍රියාත්මකවීමට හැකි නම්‍යතාවෙන් යුක්ත අය වූහ. වෙනත් අයුරකින් කිවහොත් නැටවෙන තාලයට අනුව බෙර පදය ගහන්නට මැනවින් දත් අය වූහ. බටහිර රටවල් හෝ ඒවායේ උපදේශකවරුන්ගේ හෝ පිහිට නොපතා සිය රටේ අවශ්‍යතා හඳුනාගෙන කටයුතු කළෝ වූහ. ඒ සියල්ලටම වඩා සිය රටටත්, ජාතියටත්, ජනතාවටත් නිසැකවම ආදරය කළෝ වූහ.

ඡන්ද පවත්වමින් තට්ටු මාරු ක්‍රමයට පාලනය වෙනස් නොකළහ. එවැනි තට්ටු මාරු ක්‍රමවලට කණ්ඩායම් වෙනස් කිරීම ක්‍රිකට් ක්‍රීඩාවට හොඳය. රටක් පාලනය කොට එම රට ඉදිරියට ගෙන යෑම ක්‍රිකට් ක්‍රීඩාව නොවේ.

රටක් වෙනුවෙන් සිය ජනතාවගේ අපේක්ෂිත ඉලක්ක ඉටුවන තුරු සිය වගකීම දිගටම තබාගත යුතුය. සාර්ථකත්වයට එළඹෙන්නේ එවිටය.

අප රටේ අද කෙරෙන දේ පිළිබඳව මේ ලිපියේ දැක්වූ පසුබිම යටතේ ඔබත් කල්පනාකර බලන්න.

♦ සංජය

# ජෙනරාල් ෆොන්සේකා දඟගෙට යයි





**ස**ති දෙකකට පෙර ශ්‍රීලංකාවේ බොහෝ දෙනෙකුගේ සිත් සසල කරවමින් හිටපු හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාට ශ්‍රීලංකාවේ දෙවන යුද අධිකරණය මගින් බරපතළ වැඩ ඇතිව වසර දෙකහමාරක සිර දඬුවම් පනවන ලද බව අසන්නට ලැබිණ.

සරත් ෆොන්සේකා මහතා සක්‍රීය සේවයේ (active service) යෙදී සිටියදී යුද හමුදා ටෙන්ඩර් පරිපාටියෙන් බැහැර යමින් යුද උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් යුද හමුදා පනතේ ඡේද අංක 109 (ඉ) වගන්තියේ දැක්වෙන, අපකීර්තිමත් හැසිරීම යටතේ, ඔහුට එරෙහිව චෝදනා හතරක් නගා තිබූ බවත්, ඒවා විභාග කළ දෙවැනි යුද්ධාධිකරණය විසින් එම චෝදනා හතරටම වරදකරු කරන ලද බවත්, හමුදා ප්‍රකාශක මේජර් ජෙනරාල් උයද මැදගම මහතා කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී පැවසීය. දෙවන යුද අධිකරණයේ තීන්දුව අනුව හිටපු හමුදාපතිවරයා බරපතළ වැඩ ඇතිව මාස 30 ක සිර දඬුවමකට යටත් වන බව ද ඔහු ප්‍රකාශ කළේය.

සරත් පොන්සේකා මහතාට එරෙහිව නගා තිබූ චෝදනා විභාග කොට තීන්දුව දුන් දෙවන යුද අධිකරණයට මේජර් ජෙනරාල් එම් පී පීරිස් (සභාපති), මේජර් ජෙනරාල් මහින්ද හතුරුසිංහ සහ මේජර් ජෙනරාල් ලලිත් දවුලගල යන මහත්වරු ඇතුළත් වූහ.

මේ අතර සරත් ෆොන්සේකා මහතා සක්‍රීය සේවයේ යෙදී සිටියදී දේශපාලනයේ නිරත වූ බවට නගා තිබූ චෝදනා විභාග කළ ප්‍රථම යුද අධිකරණය විසින් ඔහු එම චෝදනා වලට වරදකරු කොට අපකීර්තිමත් ලෙස හමුදා නිලයෙන් ඉවත්කිරීමට තීන්දු කළ අතර, ඒ අනුව ඔහුගේ ජෙනරාල් නිලයද, හමුදා සේවයේ දී ඔහු දිනා සිටි පදක්කම් සහ ඔහුගේ විශ්‍රාම වැටුපද අහිමි කෙරිණ.

සිය සැමියාට ලැබුණු තීන්දුව ගැන දුකට පත්ව සිටින බිරිඳ අනෝමා ෆොන්සේකා මහත්මිය මාධ්‍ය වාර්තාකරුවන් අමතමින් කීවේ, එම යුද අධිකරණ තීන්දුව රූකඩ නැටවුමකට සමාන බව ය. “ අපි කවුරුත් දැනගෙන හිටියා මේ රජය කොහොම හරි මගේ මහත්තෙයට මේ වගේ තීන්දුවක් දේවි කියලා. මේක පුදුමයක් නොවේ...” ඇය දුක්මුසු ස්වරයෙන් කීවා ය.

ජෙනරාල් ෆොන්සේකාට දෙන ලද දඬුවමට එරෙහිව අභියාචනාධිකරණයට (appeal court) පෙත්සමක් ඉදිරිපත් කිරීමට තීරණය කර ඇතැයි නීතිඥවරයෙකු වන සුනිල් වටගල මහතා මාධ්‍යයට පැවසුවේය. ජෙනරාල්වරයාගේ නිලයට වඩා පහළ නිලයන් දරන යුද අධිකරණ විනිසුරු මඬුල්ලක් මගින් තීන්දුව දී ඇති නිසා එය සාධාරණ විනිශ්චයක් නොවන බව ඔහුගේ අදහසය. පෙත්සම ඉදිරිපත්කිරීමේ අදහසත් එය බව ඔහු කියයි. එසේම සිරගෙට යාම නිසා ජෙනරාල්ගේ මන්ත්‍රීධූරයේ වෙනසක් නොවන බව ද ඔහු වැඩිදුරටත් කී ය.

එහෙත් තවත් නීතිඥවරයෙකු වන බස්නාහිර පළාත් සභා ඇමති උදය ගම්මන්පිල මහතා කියන්නේ ජෙනරාල් ෆොන්සේකාගේ මන්ත්‍රී ධූරය අහෝසි වන බවයි. ශ්‍රීලංකා ව්‍යවස්ථාවට අනුව වසර දෙකකට වඩා වැඩි සිර දඬුවමක් ලබන කෙනෙකුගේ මන්ත්‍රීධූරය අහෝසිවන බව ඔහු පෙන්වා දෙයි.

♦ කීර්ති ඩයස්

## Gen. Fonseka sent to prison for 3 years

Sri Lanka's Former Army Commander Genearal Sarath Fonseka has been found guilty on all charges by the second Court Martial on the 17 September (last month) and has been sentenced for 3 years in prison. He will also lose his right to wear rank, medals he won in his 40 year-long career in the Army, as well as his pension.

Mr Fonseka has been found guilty of violating the military tender procedure by exceeding his powers as the Army Commander and also was found guilty on the allegations against him over the military equipment deal with Hycorp Company where his son-in-law Danuna Thilakarathna was serving as a Director.

"The court martial was just a puppet show with the government holding the strings, We knew that he will be jailed so this announcement from the government today does not come as a surprise to us." Fonseka's wife Anoma Fonseka told reporters in Colombo. "

Fonseka also faces civilian charges of employing army deserters and revealing state secrets - offences that carry a 20-year jail term.

Military personnel escorted their former four-star general to the Welikada prison, after the President Mahinda Rajapakse had approved Fonseka's conviction by the military court.